# පහත රට වැසි වනාන්තරබද ග්‍රාමීය ප්‍රදේශවල සාම්ප්‍රදායික දඩයම ආශ්‍රිත අභිචාර විධි (සිංහරාජ වනාන්තරයේ වයඹ දිග බෑවුම ඇසුරිනි)

ආර්.කේ. චමින්ද කුමාර, ආර්.එම්. අනුරාධා සඳමාලි

## සාරාංශය

මානව ශිෂ්ටාචාරයෙහි දඩයමට හිමි වන්නේ අද්විතීය ස්ථානය කි. මිනිසා දඩයමට හුරු පුරුදු වූයේ අදට වසර දහස් ගණනකට පෙර ය. එඬේර යුගයට හා ගොවි යුගයට පෙර මිනිසා ජීවත් වූයේ දඩයම් යුගයේ ය. ඒ කාලය තුළ ඔහුගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ දඩයමයි. එතැන් පටන් අද දක්වා ම දඩයම මානව ජන ජීවිතය හා සම්බන්ධව පවතී. අනාදිමත් කාලයක සිට ශ්‍රී ලාංකිකයා ද දඩයමට ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇත. ඒ ඔහුගේ සෑම ප්‍රධාන ආහාර වේලක ම මූලික ස්ථානයක් "දඩ මසට" ලබා දී තිබූ බැවිනි. එම නිසා දඩයම හා බැඳුණු සුවිශේෂී අභිචාර විධි ගණනාවක් ශ්‍රී ලංකාවෙහි ප්‍රාදේශීය වශයෙන් හඳුනා ගත හැකි ය. ඒවා සියල්ල ම මිනිසාගේ ඇදහිලි හා විශ්වාස මත පදනම් ව ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයෙන් පහත රට වැසි වනාන්තර ආශ්‍රිත ග්‍රාමීය ප්‍රදේශයන් හි සාම්ප්‍රදායික දඩයම ආශ්‍රිත අභිචාර විධි මොනවාද යන්න සාකච්ඡා කිරීමට අපේක්ෂිත ය. මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වූයේ පහත රට වැසි වනාන්තර ආශ්‍රිත ග්‍රාමීය ප්‍රදේශවල සාම්ප්‍රදායික දඩයම ආශ්‍රිත අභිචාර විධි මොනවාද යන්න හඳුනා ගැනීම යි. ඊට අමතර ව දඩයම් කරනු ලබන සත්ත්ව විශේෂ හඳුනා ගැනීම, එම සතුන් මස් පිණිස සකස් කර ගැනීමට අනුගමනය කරනු ලබන ක්‍රමවේද හඳුනා ගැනීම සහ වර්තමානයෙහි දඩයම ආශ්‍රිත ප්‍රවණතා හා ගැටලු හඳුනා ගැනීම සෙසු අරමුණු අතර වෙයි. සිංහරාජ රක්ෂිත වනාන්තරයෙහි වයඹ දිග බෑවුමෙහි පිහිටා ඇති කුඩව, පෙතියකන්ද, පිටකැලේ, බුත්කන්ද, කෙටලපත්තල, කොස්ගුලන සහ කෝන්ගහකන්ද යන ගම්මාන කේන්ද්‍රකර ගනිමින් සිදු කරන ලද මෙම අධ්‍යයනය සඳහා ප්‍රශ්නාවලි සමීක්ෂණය, සම්මුඛ සාකච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණ දත්ත රැස් කිරීම සඳහා භාවිත කරන ලදී. එම දත්ත සරල ප්‍රතිශතාත්මක ක්‍රම සහ ගුණාත්මක ක්‍රම ඇසුරින් විශ්ලේෂණය කරනු ලැබීය. ඒ අනුව මෙම අධ්‍යයනයෙන් ප්‍රදේශයෙහි වාසය කරන සත්ත්ව විශේෂ 64 ක් පමණ දඩයම් කරන බව හඳුනා ගත හැකි විය. ඉන් විශේෂ 23 ක් (35.94%)

ක්ෂීරපායින් ද, විශේෂ 20 ක් (31.25%) පක්ෂීන් ද, විශේෂ 15 ක් (20.44%) මත්ස්‍යයින් ද, විශේෂ 04 ක් (6.25%) සන්ධිපාදකයින් ද, විශේෂ 01 ක් (1.56%) උරගයින් ද, විශේෂ 01 ක් (1.56%) උභය ජීවීන් ද විය.

මෙම දඩයම් ආශ්‍රිතව සිදු කරනු ලබන මූලික අභිචාර විධි අතර මහසෝන් යක්ෂයා පිදීම සඳහා ලේ ගොටු හතක් පිදීම, වැද්දන් තුන් දෙනා පිදීම සඳහා ලේ ගොටු තුනක් පිදීම ප්‍රධාන ය. ඊට අමතර ව ඉරිදා, අඟහරුවාදා සහ පසළොස්වක පෝය දිනවල දඩයමේ යාම සඳහා තෝරා ගැනීම ද ඌරන් දඩයම් කිරීම සඳහා පසළොස්වක පොහොය දිනය යොදා ගැනීම ද වැදගත් අභිචාර ක්‍රම අතර විය. එමෙන් ම ඌරන් දඩයම් කිරීම සඳහා කොටයක් යටින් තුවක්කුව බැඳීම ද විශේෂ අභිචාර විධියකි. කෙසේ වුව ද වර්තමානය වන විට ප්‍රදේශයෙහි තේ වගාව ඇතුළු වාණිජ වගා සඳහා ඉඩම් එළි පෙහෙළි වීමත්, රජයේ නීති පද්ධතිය දැඩි වීමත්, මිනිසාගේ විවේක කාලය සීමා වීමත් යන කරුණු හේතුවෙන් දඩයම අනුක්‍රමයෙන් ප්‍රදේශයෙන් ඈත්වෙමින් පවතින බව මෙම අධ්‍යයනයෙන් හඳුනා ගත හැකි විය.

**ප්‍රමුඛ පද:** දඩයම, අභිචාර විධි, ග්‍රාමීය ප්‍රජාව, සිංහරාජයේ වයඹ දිග බෑවුම

## හැඳින්වීම

දඩයම වූ කලී මානව ජන ජීවිතය හා බැඳුණු අංගයකි. මිනිසා සහ දඩයම අතර පවතින සම්බන්ධතාවය ඉතා ඈත අතීතයකට දිව යයි. එය මිනිසාගේ සම්භවයේ සිට ම පැවත එන්නකි. මිනිසා නූතන ජන සමාජයට අවතීර්ණ වන්නට පෙර ප්‍රධාන අවධි තුනක් පසු කර පැමිණ ඇත. ඒ දඩයම් යුගය, එඬේර යුගය සහ ගොවි යුගය යි. මෙයින් දඩයම් යුගයෙහි සෘජුව ම සතුන් දඩයම් කිරීම මිනිසාගේ මූලික කටයුත්ත විය. දඩයම් යුගයෙහි මිනිසා තමන්ට අවශ්‍ය සියලු ආහාර අවශ්‍යතා සහ කුඩු මහත් සෙසු කටයුතු සපුරා ගන්නා ලද්දේ දඩයම ඇසුරිනි. දඩයම් යුගයේදී මිනිසා ශිලා මෙවලම් ද උපයෝගී කොට ගෙන සතුන් දඩයම් කළ අතර ගින්නෙන් පුළුස්සා හෝ අමුවෙන් ම ඒවා ආහාරයට ගනු ලැබීය.

එඬේර යුගයේ දී දඩයමට යම් තරමක වැදගත්කමක් හිමිව පැවතුණි. එය දඩයම් යුගයේ තරම් ප්‍රබල නැත. මේ කාලයේදී වන සතුන් හීලෑ කර ගැනීම

මිනිසාගේ මූලික කටයුත්ත වී තිබුණු අතර තම ආහාර අවශ්‍යතා සඳහා අවශ්‍ය වන සතුන් දඩයම් කර ගැනීම ද සිදු කරන ලදී. මේ සඳහා බොහෝ විට ක්ෂුද්‍ර ශිලා මෙවලම් භාවිතයට ගැනුණි. ආදි මානවයා ස්ථිර වශයෙන් ජනාවාස ගත වූයේ ගොවි යුගයේදී ය. එම කාලය තුළ ද දඩයමට යම් වැදගත්කමක් හිමිව පැවතුණි. විශේෂයෙන් ම ගමෙහි වගා බිම්වලට පැමිණෙන වන සතුන් දඩයම් කර ගැනීම සඳහා විවිධ ක්‍රමවේද භාවිත කිරීමට ද එකල මිනිසා හුරු පුරුදු වී සිටියේය. එඬේර සහ ගොවි යුගවල දී සතුන් අල්ලා ගැනීම සඳහා උගුල් ඇටවීම, වලවල් කැපීම, කොළ දිය කිරීම වැනි ක්‍රමවේද ද භාවිත කරන ලදී.

සිංහල ජන සමාජයෙහි ද දඩයමට සුවිශේෂ ස්ථානයක් හිමිව පැවතුණි. විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ තෙත් කලාපයෙහි සහ වියළි කලාපයෙහි එය පැහැදිලිව හඳුනා ගත හැකි ය. පුරාතනයේ සිට ම සිංහලයා දඩමසට ප්‍රියමනාප ය. එම නිසා ඔහුගේ ආහාර වේලට අවශ්‍ය දඩ මස් සපුරා ගන්නා ලද්දේ දඩයමෙනි. දිගාමඩුළු ගැමියාට ආහාරයට දඩමස් නැතුවම බැරි විය. ඔවුන් ඒ බව කියන්නේ "දඩමාළු නැතුං කන්ට බෑ බොටා" යනුවෙනි (කහඳගමගේ, 2012, 55). ඒ සඳහා විවිධ සම්ප්‍රදායික ක්‍රමවේද ගණනාවක් අනුගමනය කෙරුණි. උගුල් ඇටවීම, තොණ්ඩු බැඳීම, වලවල් කැපීම, උල් සිටුවීම, ආදිය ප්‍රධානය. ඒ හැරුණු විට දඩ බල්ලෝ ද ගැමියනට දඩයමට උපකාරී වූහ. දඩයමට හුරු කළ දඩ බල්ලන් දෙතුන් දෙනෙකු හෝ නොමැති ගෙයක් එකල බින්තැන්නේ නොතිබූ බව පියසේන කහඳගමගේ මහතා සඳහන් කරයි. හාවුන්, මීමින්නන් සහ තලගොයින් ඇල්ලීමට දඩ බල්ලන්ට හැකි ය. දඩයම් සඳහා කැලේ යාම රැකුලෙ පැද්දීම හෝ මිනි පන්දමේ යාම යනුවෙන් හඳුන්වා ඇත (කහඳගමගේ, 2012, 56). දඩයම් කිරීමේදී ඔවුන් ඒවා කළේ චාරිත්‍ර අනුවය. දිය බොමින් සිටි සතෙකුට හෝ ගැබ්බර සතෙකුට වෙඩි තැබීම ද පැටවුන්ට හෝ ගැහැනු සතුන්ට වෙඩි තැබීම ද සිදු නොකළ අතර දිය බොන සතෙකුට වෙඩි තැබුවේ ඌ දිය බී ඉවත් වන විට ය (කහඳගමගේ, 2012, 56). දඩයමක් කර අවසන සතා මස් කර ගත යුතු ය. එය හැඳින්වෙන්නේ සතා කැපීම යනුවෙනි. විශාල සතෙකු දඩයමට හසු වූ විට පංගු බෙදීම සිදු කළ යුතු ය. එහිදී ගම කොටහ, ගුරු මාළු, තුවක්කු අඬේ හා එල්ලුම් පොට, කැපුම්තියමේ, දඩයම් පංගුව සහ හවුල් පංගුව යනුවෙන් සතා කපා පංගු බෙදීමේදී පංගු හයක් වෙන් කෙරේ (කහඳගමගේ, 2012, 57). ගමේ ප්‍රධානියා වන ගමරාලට තෑගි වශයෙන් දෙන කොටස ගම පංගුව යනුවෙන් ද දඩයම ඉගැන්වූ ගුරුවරයාට දෙන කොටස

ගුරු මාළු යනුවෙන් ද තුවක්කුව අයිතිකරුට දෙන කොටස තුවක්කු අඳේ හා එල්ලුම් පොට යනුවෙන් ද සතා මස් කළ තැනැත්තාට දෙන කොටස කැපුම්නියමේ යනුවෙන් ද දඩයක්කරුට හිමි විය යුතු කොටස දඩයම් පංගුව යනුවෙන් ද දඩයමට විවිධාකාරයෙන් සහාය වූ අයට ලැබෙන කොටස හවුල් පංගු යනුවෙන් ද හැඳින්වේ (කහඳගමගේ, 2012, 57). ශ්‍රී ලංකාව අතීතයේ සිට ම කෘෂි කාර්මික රටක් බැවින් හේන් ගොවිතැන හා කුඹුරු ගොවිතැන ආශ්‍රිතව දඩයම බහුල වශයෙන් සිදු විය.

මානව ජන සමාජයේ ආරම්භයේ සිට ම පැවත එන මෙම දඩයම හා බැඳුණු විවිධ අභිචාර විධි සහ විශ්වාස ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක ම පාහේ දක්නට පුළුවන. ඒවායෙහි බොහෝදුරට ප්‍රාදේශීය වශයෙන් විවිධත්වයක් දක්නට පුළුවන. නූතන ජන සමාජය ගෝලීයකරණය සහ විවෘත ආර්ථිකය යන සාධක නිසා වෙනසකට බඳුන්ව ඇති මෙවන් කාල වකවානුවක ඉහත දඩයම් ක්‍රම, ඒ හා බැඳි අභිචාර සහ විශ්වාස ආදිය ද ඉතා වේගයෙන් ජන සමාජයෙන් දුරස් වෙමින් පවතී. එනිසා මේ හා සම්බන්ධ අභිචාර හා විශ්වාස පිළිබඳව අධ්‍යයනය කිරීම කාලෝචිත ය. එම නිසා මේ සම්බන්ධ තොරතුරු බහුල වශයෙන් දක්නට ලැබෙන පහත රට වැසි වනාන්තරික ප්‍රදේශයක් වන සිංහරාජ වනාන්තරයේ වයඹ දිග බෑවුම කේන්ද්‍ර කොට ගෙන මෙම අධ්‍යයනය සිදු කෙරේ.

## අධ්‍යයන අරමුණ

### ප්‍රධාන අරමුණ

පහත රට වැසි වනාන්තර ආශ්‍රිත ග්‍රාමීය ප්‍රදේශයන් හි සාම්ප්‍රදායික දඩයම් ක්‍රම හා ඒ ආශ්‍රිත අභිචාර විධි හඳුනා ගැනීම

### සුවිශේෂී අරමුණු

- ❖ ප්‍රදේශයෙහි දඩයමට හසු වන සත්ත්ව විශේෂ හඳුනා ගැනීම
- ❖ සතුන් දඩයම් කළ පසු එම සතුන් මස් ලෙස සකසා ගැනීමට භාවිත කරන ක්‍රමවේද හඳුනා ගැනීම
- ❖ සතුන් දඩයම් කිරීම සඳහා උපයෝගී කර ගන්නා සම්ප්‍රදායික ක්‍රමවේද හඳුනා ගැනීම


❖ දඩයම ආශ්‍රිත නව ප්‍රවණතා සහ එහි වත්මන් ස්වරූපය හඳුනා ගැනීම

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීම මූලික වශයෙන් ප්‍රශ්නාවලි සමීක්ෂණය, සම්මුඛ සාකච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණ යන ක්‍රමවේද ඇසුරින් සිදු කරන ලදී. ප්‍රශ්නාවලි සමීක්ෂණය සසම්භාවී නියැදිය යටතේ දඩයම හා සම්බන්ධ ප්‍රජාව ඉලක්ක කර ගනිමින් සිදු කරන ලදී. එලෙස රැස් කරගන්නා ලද දත්ත සරල ප්‍රතිශතාත්මක ක්‍රම හා ගුණාත්මක ක්‍රමවේද ඔස්සේ විශ්ලේෂණය කරන ලදී.

## අධ්‍යයන ප්‍රදේශය

සිංහරාජ වනාන්තරයෙහි වයඹ දිග බෑවුමෙහි පිහිටි කුඩාව, පෙතියකන්ද, පිටකැලේ, කෙටලපත්තල, කෝන්ගහකන්ද, කොස්ගුලන යන ගම්මාන අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී.




මූලාශ්‍රය: 1:50000 භූලක්ෂණාත්මක සිතියම, 1981

## දත්ත විශ්ලේෂණය

සිංහරාජ වයඹ දිග බෑවුමෙහි දඩයම හා බැඳි අභිචාර විධි පිළිබඳ ව සාකච්ඡා කරන විට අපගේ අවධානය යොමු විය යුතු කරුණු කිහිපයකි. ඒ අතරින්

අපගේ මූලික අවධානය දඩයම් කරන ලද සතුන් පිළිබඳ ව යොමු කිරීමේදී විවිධ සත්ත්ව විශේෂ දඩයම් කර ඇති බව හඳුනා ගත හැකි විය. එය පහත දැක්වෙන වගුව නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි කර ගත හැකි ය.

**වගු අංක 01: දඩයම් කරන ලද සත්ත්ව විශේෂ ප්‍රමාණය පිළිබඳ තොරතුරු**

| සත්ත්ව විශේෂය | ප්‍රමාණය | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ක්ෂීරපායින් | 23 | **35.94%** |
| පක්ෂීන් | 20 | **31.25%** |
| මත්ස්‍යයින් | 15 | **23.44%** |
| උරගයින් | 01 | **1.56%** |
| සන්ධිපාදකයින් | 04 | **6.25%** |
| උභය ජීවීන් | 01 | **1.56%** |
| එකතුව | 64 | **100.00%** |

මූලාශ්‍රය: ප්‍රශ්නාවලි සමීක්ෂණය, 2013

ඉහත වගුවේ දැක්වෙන ආකාරයට ප්‍රදේශයෙහි දඩයම් කරන ලද සතුන්ගෙන් විශේෂ 23 ක් පමණ (35.94%) ක්ෂීරපායි සතුන් ය. එමෙන් ම තවත් විශේෂ 20 ක් (31.25%) පක්ෂීහුය. ඊට අමතරව මත්ස්‍ය විශේෂ 15 ක් (23.44%), උරග විශේෂ 01 ක් (1.56%), සන්ධිපාදක විශේෂ 04 ක් (6.25%) ක් ද, උභය ජීවී විශේෂ 01 ක් (1.56%) පමණ ද දඩයම් කර ඇත.

ඉහතින් සඳහන් කරන ලද ආකාරයට ප්‍රදේශයෙහි දඩයම් කරන ලද සත්ත්ව විශේෂයන් පිළිබඳ තොරතුරු වඩාත් පැහැදිලිව හඳුනා ගැනීම සඳහා පහත දැක්වෙන වගුව උපයෝගී කර ගත හැකි ය.

වගු අංක 02: දඩයම් කරන ලද සත්ත්ව විශේෂ පිළිබඳ තොරතුරු

| ක්ෂීරපායින් | පක්ෂීන් | මත්ස්‍යයින් | උරගයින් | සන්ධිපාදකයින් | උභය ජීවීන් |
|---|---|---|---|---|---|
| ඉත්තෑවා | මාවිලගොයා | දණ්ඩියා | තලගොයා | ඉස්සා | ඉබ්බා |
| ගෝනා | බටගොයා | ආඳ | | කකුළුවා | |
| දඬුලේනා | කෑදැත්තා | හීතමස්සා | | කූනිස්සා | |
| වල් මීයා | වළි කුකුළා | හොරපොලයා | | ගල් ඉස්සා | |
| ඌරා | උකුස්සා | ගල්පාඩියා | | | |
| උගුඩුවා | කුරුළුගොයා | මගුරා | | | |
| වඳුරා | වඳුරුගොයා | අංකුට්ටා | | | |
| ඕළුවා | කෑරලා | තෙලියා | | | |
| දිවියා | නීලකොබෙයියා | යොන්නු | | | |
| තලපයා | අළුකොබෙයියා | වැලි ගොවුවා | | | |
| කබල්ලෑවා | සුදු කොකා | තලකොස්සා | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| රිළවා | කොරවක්කා | බිංඇටයා | | | |
| මහ කඹයා | දියකාවා | ගංආරා | | | |
| කිරි වවුලා | ගොයම්කුරුල්ලා | වලපොත්තා | | | |
| හෝතඹ යා | පලාකොට්ටෝර ුවා | කනෙයා | | | |
| ලේනා | ගේ කුරුල්ලා | | | | |
| හුඹං මීයා | උළමා | | | | |
| පැණි උගුඩුවා | බකමූණා | | | | |
| හම්බාවා | බස්සා | | | | |
| ගස් මීයා | ඇටිකුකුළා | | | | |
| කොල බළලා | | | | | |
| උරුලෑවා | | | | | |
| හාවා | | | | | |

මූලාශ්‍රයඃ ප්‍රශ්නාවලි සමීක්‍ෂණය, 2013

එමෙන් ම ඉහත දක්වන ලද සතුන් මස් ලෙස සකසා ගැනීම සඳහා විවිධ ක්‍රමවේද අනුගමනය කර තිබෙන බව පහත වගුවෙහි දැක්වෙන දත්ත වලින් පැහැදිලි වේ. සතුන් දඩයම් කිරීමෙන් අනතුරුව එම සතුන් ගේ හම පිච්චීම, හම ගැලවීම, තැම්බීම සහ වෙනත්

ක්‍රමවේදවලින් දඩයම් කරන සතුන් මස් ලෙස සකසා ගෙන ඇති බව පැහැදිලි ය.

**වගු අංක 03: දඩයම් කරන ලද සතුන් මස් ලෙස සකසා ගැනීමට අනුගමනය කරන ලද ක්‍රමවේදය පිළිබඳ තොරතුරු**

| හම ගැලවීම | තැම්බීම | හම පිච්චීම | වෙනත් |
|---|---|---|---|
| ගෝනා | ඉත්තෑවා | දඬුලේනා | දණ්ඩියා |
| උගුඩුවා | මාවිලගොයා | ඌරා | ආඳ |
| වඳුරා | බටගොයා | කබල්ලෑවා | හීතමස්සා |
| ඕළුවා | කෑදැත්තා | වල් මීයා | හොරපොලයා |
| දිවියා | වළි කුකුළා | | ගල්පාඩියා |
| තලපයා | උකුස්සා | | මගුරා |
| තලගොයා | කුරුළුගොයා | | අංකුට්ටා |
| රිළවා | වඳුරුගොයා | | තෙලියා |
| හෝතඹයා | කෑරලා | | යොන්නු |
| මහකඹයා | නීලකොබෙයියා | | වැලි ගොවුවා |
| කිරිවවුලා | අළුකොබෙයියා | | තලකොස්සා |
| ලේනා | සුදු කොකා | | බිංඇටයා |
| හුඹංමීයා | කොරවක්කා | | ගංආරා |
| පැණිඋගුඩුවා | දියකාවා | | වලපොත්තා |
| හම්බාවා | ගොයම්කුරුල්ලා | | කනෙයා |

| | | | |
|---|---|---|---|
| ගස්මීයා | පලාකොට්ටෝරුවා | | ඉස්සා |
| කොලබළලා | ගේ කුරුල්ලා | | කුනිස්සා |
| උරුලෑවා | උළමා | | ගල් ඉස්සා |
| හාවා | බකමූණා | | |
| | බස්සා | | |
| | ඇට්කුකුළා | | |
| | ඉබ්බා | | |
| | කකුළුවා | | |

මූලාශ්‍රයඃ ප්‍රශ්නාවලි සමීක්ෂණය, 2013

දඩයම් කෙරෙන සතුන්ගේ හම ගැලවීමෙන් මස් සකස් කර ගන්නා අතර තවත් සතුන් තම්බා සුද්ධ කර මස් සකස් කර ගනී. බොහෝ විට පක්ෂීන් තම්බාගෙන උන්ගේ පිහාටු ඉවත් කර මස් ලෙස සකසා ගනී. එමෙන් ම මත්ස්‍ය විශේෂ බොහොමයක් මස් ලෙස සකසා ගැනීමේ පහසුවට වැලි මත දැමීම, පිලී ඉවත් කිරීම, අළු තැවරීම යන ක්‍රමවේදයන් සිදු කරනු ලබයි. ඉහත වගුවේ දැක්වෙන්නේ එසේ සකසා ගන්නා ක්‍රමවේදයන් ය.

මෙම ප්‍රදේශය දඩයමට ද ඉතා ප්‍රසිද්ධ ය. ඒ නොයෙකුත් සත්ව වර්ගවලින් මෙහි භූමිය පොහොසත් නිසා ය. මිනිසාගේ දඩයමට හසුවන ඉතා කුඩා ප්‍රමාණයේ වල් මීයා, මී මින්නා ආදීන්ගේ සිට ඌරා, ගෝනා දක්වා වු විශාල සතුන් ද මෙහි බහුල ය. මේ සතුන් ප්‍රදේශය අවට මිනිසාගේ ගොදුරු බවට පත්වන අවස්ථා බොහෝ ය. ප්‍රදේශයේ දඩයම සම්බන්ධව බලන විට ඒ හා බැඳි විවිධ අංග රාශියක් පවතින බව හඳුනා ගත හැකි විය. විශේෂයෙන් ම දඩයම් ක්‍රම, දඩයම් ආශ්‍රිත අභිචාර විධි, ඇදහිලි විශ්වාස ආදී මේ සියල්ල ම ප්‍රදේශයේ දඩයම ආශ්‍රිතව බැඳී ඇත.

මිනිසුන් දඩයමට යන්නේ රාත්‍රි කාලයේදී ය.  ඒ රාත්‍රි කාලයේ ද
දිවා කාලයේ සැඟව උන් සතුන් ගල් ගුහා  ගස් බෙන ආදියෙන් පිටත
පැමිණ ආහාර හා ජලය සොයා වනයේ  ඇවිදින බැවිනි. මෙලෙස ඇවිදින
බොහෝ සතුන් ඉතා පහසුවෙන් දඩයමට හසුකර ගත හැකි ය. සතුන්
දඩයමට ගොදුරු කර ගන්නා ක්‍රම වේද ගණනාවක් ම ප්‍රදේශයේ දැක ගත
හැකි ය. එහි ප්‍රධාන ම ක්‍රම වේදය උගුල් ඇටවීම ය. උගුල් වර්ග දෙකකි. එ
කට්ට උගුල් හා ඇඳි උගුල යනුවෙනි. කට්ට උගුල ඇටවීම ඉතා සරල ය. එ
අටවන්නේ අහරක් හරහාය. අහර යනු සතුන් නිතර එහා මෙහා යන
මාර්ගයයි. අහර දෙපසින් අඩි හය හතක් පමණ උස ඉනි දෙකක් සිටවනු
ලබයි. ඉන් එක ඉන්නක මැද කට්ටයක්  කපයි. අනතුරුව අනෙක් ඉන්න
නමා පෙර කී ඉන්නෙහි කට්ටයට අමුණනු ලැබේ. ඉන් පසුව නවන ල
ඉන්නෙහි තොණ්ඩුව ගැට ගසා එය අහරෙන් තබයි. එවිට රාත්‍රී කාලයට එහා
මෙහා ඇවිදින සතෙකු එම අහර දිගේ පැමිණි විට තොණ්ඩුවෙහි හිර වෙයි
ඌ තොණ්ඩුවෙහි හිර වූ විගස දැඟලීමට පටන් ගනී. එම දැඟලිල්ල නිසා
කට්ටෙහි අමුණන ලද උගුල් ඉන්න සතාද සමග ඉහලට එසවේ. එවිට
සතාගේ බෙල්ල තදින් තොණ්ඩුවට හිර වීම නිසා හුස්ම ගැනීමට
නොහැකිවීමෙන් ඌ මරණයට පත් වේ. බොහෝ දුරට මෙවැනි කට්ට උගුල්
අටවනු ලබන්නේ වල් මීයන්, ඉත්තෑවුන් සහ හාවුන් වැනි සතුන් ඇල්ලීම
සඳහා ය.


**ඡායාරූප අංක 01  දඩයම පිණිස සකසන ලද කට්ට උගුලක්**



මූලාශ්‍රය: ක්ෂේත්‍රීය නිරීක්ෂණ, 2013

ඇඳි උගුල සාදා ගැනීම තරමක් අසීරු ය. මෙයද අඳින්නේ ද අහරක් හරහා ය. අහර දෙපසින් තරමක උස ලී ඉනි දෙකක් සිටවනු ලබයි. එම ලී දෙක මුදුනෙහි හරහට ලී දෙකක් ගැට ගසනු ලබයි. එම ලී දෙක මැදින් තවත් කුඩා ලී කැබලි දෙකක් ගැට ගසනු ලබයි. ඉන් පසුව තරමක් එහායින් උගුල් ඉන්න සිටුවා එය නවා ඉන්නෙහි කෙළවර තොණ්ඩුව ගැට ගසයි. ඊට පෙර උගුල් ඉන්නෙහි තොණ්ඩුව ගැට ගසන ස්ථානයට මදක් ඈතින් කණා කුර ගැට ගසයි. කණා කුර යනු තොණ්ඩුවට සතෙකු පැටලුන විට උගුල් ඉන්න ගැස්සීමට සකසා ඇති ලීයයි. එම කණා කුර උගුල් ඉන්නේ සිට පොළොවට සමාන්තරව ගැට ගසා ඇති කෝටුවකට සම්බන්ධ කරයි. ඉන් පසුව තොණ්ඩුව ඉහළ හරස් ලී දෙක අතර ගැට ගසන ලද ලී දෙක මැදින් අහර හරහා වැටෙන පරිදි උගුල් ඉන්නෙහි දවටනු ලැබේ. මෙම කටයුතු වලින් පසුව ඇඳි උගුල දෙපස ඉතා හොඳින් ආවරණය කර අහර පමණක් සතුන්ට ගමන් කළ හැකි පරිදි විවෘත කර තබයි. රාත්‍රියට මෙම අහර දිගේ ගමන් කරන සතෙකු ඇඳි උගුල හරහා යාමට තැත් කිරීමේ දී උගේ බෙල්ල නොදැනුවත්ව තොණ්ඩුවට අසුවේ. ඉන් පසු ඌ දඟලන විට පොළොවට සමාන්තරව සිටුවන ලද කොටුවෙහි හැපීමෙන් කණා කුර ගැස්සේ. එවිට උගුල් ඉන්න සතා ද සමග ගැස්සී ගොස් ඇඳි උගුලෙහි ඉහළ ගැට ගසා තිබෙන හරස් ලී දෙකෙහි හිරවේ. එවිට තව තවත් සතාගේ බෙල්ලට වැටී තිබෙන තොණ්ඩුව තද වීම නිසා හුස්ම හිරවීමෙන් ඌ මරණයට පත්වේ. බොහෝ විට ප්‍රදේශයේ වල් මීයන්, ඉත්තෑවන් හා හාවුන් වැනි සතුන් දඩයම් කිරීම සඳහා මෙම ක්‍රමය උපයෝගී කරගනී.


**ඡායාරූප අංක 02: දඩයම පිණිස සකසන ඇඳි උගුලක්**



මූලාශ්‍රය: ක්ෂේත්‍රීය නිරීක්ෂණ, 2013

හබක ද ප්‍රදේශයේ දඩයම සඳහා භාවිතා කරනු ලබන මෙවලමකි. මෙය සාදාගනු ලබන්නේ මැස්සක් වෙලීමෙනි. එම මැස්ස පුවක් ලී හෝ ලී කුඩුවලින් සාදා ගනී. ඉන් පසුව මැස්සේ එක් කෙළවරක් ඉහළට ඔසවා එය රැඳවීමට බලට්ටක් සිටුවයි. බලට්ටක් යනු ගසක අතු දෙපසට විහිදීගිය කුඩා අතු කැබැල්ලකි. එම බලට්ට උඩින් නැවත හරහට ලීයක් බඳිනු ලබයි. ඉන් පසුව එම ලීයට කණාකුර සම්බන්ධ කෙරේ. එය බිමට සම්බන්ධවේ. අනතුරුව හබක ඇතුළින් කෝටුවක් සිටුවයි. එම කෝටුවේ සිට තවත් කෝටුවක් පොළොවට සමාන්තර ලෙස කණා කුරට අමුණයි. ඊට පසු මැස්ස උඩින් විශාල ගල් කිහිපයක් ලබයි. එසේම හබක යට වනසතුන් ආහාරයට රුචි මයියොක්කා අලයක්, කිරි අල පඳුරක් හෝ බතල වැල් කිහිපයක් තබයි. හබක ඌරන්, ඉත්තෑවුන් හා තලපයින් දඩයම් කිරීමට සුදුසු ය. එම සතුන් හබක යට තිබෙන දෙය ආහාරයට ගැනීමට යාමේදී පොළොවට සමාන්තරව තබා ඇති කෝටුවේ කකුල හැපීමෙන් එය ගැලවේ. එවිට කණා කුර ගැස්සී හබක එම සතාගේ ඇඟ උඩට වැටේ. විශාල බරක් සහිතව එය ඇඟට කඩා වැටීම නිසා එම සතා ඒ ස්ථානයේදීම හබකට යටවී මරුමුවට පත්වේ. ඌරෙකු දඩයම් කිම සඳහා තනන ලද හබකක් නම් ඒ මත විශාල ගල් පැටවිය යුතු අතර ඊට වඩා කුඩා සතෙකු දඩයම් කිරීම සඳහා සාදන ලද හබකක් නම් ප්‍රමාණයෙන් කුඩා ගල් හබක මත පැටවේ.

**ඡායාරූප අංක 03: දඩයම පිණිස සකසන ලද හබකක්**



මූලාශ්‍රය: ක්ෂේත්‍රීය නිරීක්ෂණ, 2013

වගා බිම්වලට පැමිණෙන සතුන් දඩයම් කිරීම සඳහා උපයෝගී කරගන්නා තවත් ක්‍රමවේදයකි තොණ්ඩුව. මෙය ඉතා සරල ය. නිතර සතුන් එහා මෙහා යන අහරක් හරහා මෙය අදිනු ලබයි. අහර දෙපසින් ලී දඬු දෙකක් සිටුවා ඒ දෙක අතර කම්බියකින් තොණ්ඩුවක් සාදා තබයි. ගෝනෙකුට තොණ්ඩුව බඳිනවා නම් එය මිනිසෙකුගේ ඉන මට්ටමින් ද, ඌරෙකුට නම් බිම සිට අඟල් නමයක් පමණ උසකින් ද තොණ්ඩුව අදී. රාත්‍රී කාලයට මේ හරහා යන ඌරෙකුගේ හෝ ගෝනෙකුගේ ගෙලට තොණ්ඩුව වැටුණු පසු ඌ දඟලන විට එය ටික ටික තද වේ. ඉන් පසුව ඌට හුස්ම ගැනීමට අපහසු වීමෙන් මරණයට පත්වේ. දැනට ද ප්‍රදේශයේ ඉතා බහුලව දක්නට ලැබෙන දඩයම් ශිල්ප ක්‍රමයක් ලෙස මෙය හඳුනා ගත හැකි ය.

**ඡායාරූප අංක 04: දඩයම පිණිස සකසන ලද තොණ්ඩුවක්**



මූලාශ්‍රය: ක්ෂේත්‍රීය නිරීක්ෂණ, 2013

වලවල් කැපීම ද ප්‍රදේශයේ දඩයම සඳහා භාවිත ක්‍රමවේදයකි. ඌරන්, ගෝනුන් ආදී සතුන් නිතර ගැවසෙන ස්ථානවල විශාල වලක් හාරනු ලබයි. එහි පතුලේ ඉතා තියුණු උල් හිටවයි. ඉන්පසු වියන ලද බට පැලැල්ලක් ගෙන වලේ කට වසා දමා ඊට උඩින් පස් දමා බතල හෝ කිරි

අල ගස් සිටුවනු ලබයි. ටික කාලයක් යන විට එම බට පැලැල්ල දිරාපත්වේ. එවිට බතල හෝ කිරි අල කෑමට වන සතුන් ඒ මතට නැගීමත් සමග ම ඌ මැස්සත් සමග ම වලට වැටී වලේ සිටුවා ඇති තියුණු උල් ඇනීමෙන් මරණයට පත්වේ.

මෙම ක්‍රමවලට අමතර ව ඉඩාරේ, පාමල, උගුඩු උගුල, පෙත්ත ආදිය ද සතුන් දඩයම් කිරීමට යොදා ගනී. ඉඩාරේ ප්‍රමාණයෙන් විශාල ඌරන්, ඉත්තෑවුන් වැනි සතුන් ඇල්ලීමට ද, උගුඩු උගුල කිතුල් ගස්වල තෙලිදිය බීමට පැමිණෙන උගුඩුවන් අල්ලාගැනීමටත්, පාමල වලි කුකුළන් අල්ලා ගැනීමටත් යොදාගනී. කෙසේ වුවද මෙම දඩයම් ක්‍රම කාලයත් සමග අනු ක්‍රමයෙන් ප්‍රදේශයෙන් ඈත් වී යන බව හා ඒ හා බැඳුණු තාක්ෂණික ශිල්ප ක්‍රම ද ඉතා ම වේගයෙන් ඈත් වෙමින් යන බව පැහැදිලි ව හඳුනා ගැනීමට ලැබුණි.

ඒ හැරුණු විට දඩයම ආශ්‍රිත ව අභිචාර විධි ගණනාවක් ද ප්‍රදේශයේ දක්නට ලැබේ. සෑම දඩයමක් අවසානයේ දී ම එම අභිචාර හා විශ්වාසයන්ට මුල් තැනක් දීම කැපී පෙනෙන ලක්ෂණයකි. ප්‍රදේශයේ ජනප්‍රිය ම දඩයම වන්නේ ඌරු දඩයමයි. ඌරෙකු දඩයම්කර මස්කර අවසන් කළ පසු උගේ ශරීරයේ සියලු කොටස් වලින් ටික ටික ගෙන ලේ ගොටු හතක් තබයි. ඒ මහසෝන් යක්ෂයා වෙනුවෙනි. එයට හේතුව ඌරාගේ භාරකරු මහසෝනා වීමත් මහසෝනා ගමන් ගන්නා වාහනය ඌරා වීමත් ය. ගෝනෙකු හෝ ඉත්තෑවෙකු දඩයමට හසුවුණි නම් උගේ කොටස් ගෙන ලේ ගොටු තුනක් පමණ තබයි. ඒ වැද්දා වෙනුවෙනි. වැද්දා යනු ප්‍රදේශයේ ජනතාව අතර පවතින අදෘශ්‍යමාන සංකල්පයකි. කැලේ වාසය කරන සතුන්ගේ භාරකරු වැද්දා බවත් තමාට දඩයම් ලැබෙන්නේ ඔහුගේ පිහිටෙන් බවත් ප්‍රදේශයේ ගොවිහු විශ්වාස කරති. ඒ අනුව කළු වැද්දා, හෝවැද්දා සහ මස් වැද්දා වෙනුවෙන් ලේ ගොටු තැබේ. එසේ ම දඩයමට සතෙකු අසුවූ විට උගේ සිරුර තනි කරන්නේ නැත. සතා අසුවූ වේලාවේ සිට ඌ ආහාරයට ගන්නා තෙක් ම ඒ මස් අසල ආයුධයක් තබයි. එමෙන් ම මස් උයා ලිපෙන් බාගත් පසුව ද එයට යකඩ කැබැල්ලක් දැමීම ද සිරිතකි. මස් පිස අවසන් වී ආහාරයට ගැනීමට පෙර පළමු මස් කැබැල්ල වැද්දා වෙනුවෙන් ගෙම්බුලට දමනු ලබයි. ඒ වැද්දා මස් දෙස බලා සිටින නිසා හා එම සතාගේ භාරකරු වැද්දාය යන විශ්වාසය ගැමියන් තුළ පවතින හෙයිනි. එසේ ම දඩයමට හසුවූ

සතා තනියම රැගෙන යාමට නොහැකි තරම් විශාල එකෙකු නම් ඌ අල්ලන්නේවත් නැතිව කවුරුන් හෝ පැමිණෙන තුරු උගේ ඇඟ උඩින් ආයුධයක් තබයි.

සාමාන්‍යයෙන් දඩයමේ යාමට ඉරිදා, අඟහරුවාදා සහ පසලොස්වක පොහොය දින ඉතා සුදුසු බව ප්‍රදේශයේ ජනතාවගේ පිළිගැනීම ය. එවන් දිනවල දඩයමේ ගිය විට දඩයම අනිවාර්ය බව ඔවුන්ගේ මතයයි. ඒ වගේම අඟහරුවාදා සහ පසලොස්වක පොහොය දින එක ම දිනක යෙදී තිබුණහොත් දඩයම අනිවාර්ය බව විශ්වාස කෙරේ. ඊට අමතර ව පසලොස්වක පොහොය දිනය ඌරු දඩයමට සුදුසුය. එයට හේතුව මහසෝනා දේව සභාවට යාමය. එවිට ඌරා තොණ්ඩුවකට හෝ උගුලකට හසුවීමේ ඉඩකඩ වැඩි බව ප්‍රදේශයේ ජනතාව පිළිගනී. ඒ හැරුණු විට පිසින ලද මස් රැගෙන යන වවිට තනියට අඟුරු කැබැල්ලක් හෝ ආයුධයක් භාජනය මත තබා ගෙන යාමද දඩයම හා සම්බන්ධව ප්‍රදේශයේ පවතින විශ්වාස අතර තිබෙන හඳුනාගත හැකිය.

## අධ්‍යයනයෙහි ප්‍රතිඵල

අධ්‍යයන ප්‍රදේශයෙහි ඉතා දීර්ඝ කාලයක සිට දඩයම පැවත ඇති බව පැහැදිලි විය. ඒ අනුව  දඩයම හා සම්බන්ධ ප්‍රදේශයෙහි වාසය කරන ක්ෂීරපායි විශේෂ 23 ක් පමණ (35.94%) ද පක්ෂී විශේෂ 20 ක් (31.25%) පමණ ද මත්ස්‍ය විශේෂ 15 ක් (23.44%) පමණ ද උරග විශේෂ 01 ක් (1.56%) පමණ ද සන්ධිපාදක විශේෂ 04 ක් (6.25%) ක් පමණ ද උභය ජීවී විශේෂ 01 ක් (1.56%) පමණ ද දඩයම් කර ඇත. ඉහත තොරතුරුවලට අනුව දඩයමට ලක්ව ඇති මුළු සත්ත්ව විශේෂ ප්‍රමාණය 64 කි. මෙම සතුන් දඩයම් කළ පසු ඔවුන් මස් ලෙස සකසා ගැනීම සඳහා ද විවිධ උපක්‍රම භාවිත කර ඇති බව හඳුනා ගත හැකි විය. ඒ අතර හම ගැලවීම, තැම්බීම සහ පිච්චීම ප්‍රධාන ය. ඉන් පසුව මේ හා සම්බන්ධ නොයෙකුත් අභිචාර සහ ඇදහිලි විශ්වාස ගණනාවක් ම දක්නට ලැබෙන බව හඳුනා ගත හැකි විය.

## නිගමන සහ යෝජනා

මෙම අධ්‍යයනය තුළින් ප්‍රධාන නිගමන කිහිපයකට පැමිණීමට හැකි විය. ඒ අතර අධ්‍යයන ප්‍රදේශයෙහි දඩයම සාමාන්‍ය මානව කටයුත්තක් ලෙස පැවති තිබීම, රජයේ නීති රීති පද්ධතිය සහ වගා බිම් එළි පෙහෙළි කිරීම නිසා බොහෝ සත්ත්ව විශේෂ අද වන විට ප්‍රදේශයෙන් වඳ වී යාම, වර්තමාන ජන ප්‍රජාවගෙන් මෙම අභිචාර පිළිබඳ දැනුම ක්‍රමයෙන් ඈත් වෙමින් පැවතීම සහ වර්තමාන මිනිසා දඩයමින් ඈත් වීම සඳහා කාර්යබහුල ජීවන රටාව ද ඉවහල් වීම දැක්විය හැකි ය. ප්‍රධාන යෝජනා ලෙස ප්‍රජාව සතුව පවතින දඩයම සම්බන්ධ අභිචාර ඒකරාශී කිරීම, සතුන් සම්බන්ධව පවතින විශ්වාසයන් එම සතුන්ගේ පැවැත්මට හා සංරක්ෂණයට යොදා ගැනීම හා එම විශ්වාසයන් සාමාන්‍ය ජන ජීවිතය සඳහා යොදා ගැනීම (මස් ආදිය පිසින විට හා ආහාරයට ගැනීමට පෙර එයට දෙහි ස්වල්පයක් දැමීම) පෙන්වා දිය හැකි ය.

**දත්ත දායකයෝ**

01. කරුණාදාස, යූ, ජී. වයස අවුරුදු 65, අකුරු හැකියාව ඇත, රැකියාව ගොවිතැන, ලිපිනය : වැවගම, කොක්කාවිට, කලවාන. 2013.09.14 දින සිය නිවසේදී කළ සම්මුඛ සාකච්ඡාවකි.

02. ජයරත්න, සුනිල්. වයස අවුරුදු 38, අකුරු හැකියාව ඇත, රැකියාව ගොවිතැන, ලිපිනය : පෙතියකන්ද, කුඩව, වැද්දාගල 2013.09.20 දින කරුණාදාස මහතාගේ පරණ නිවසේදී කරන ල සම්මුඛ සාකච්ඡාවකි.

03. ජයරත්න, යූ, ජී, වයස අවුරුදු 36, අකුරු හැකියාව ඇත, සිංහරාජ මාර්ගෝපදේශක, ලිපිනය : වැවගම, කොක්කාවිට, කලවාන 2013.09.20 දින කරුණාදාස මහතාගේ පරණ නිවසේදී කරන ල සම්මුඛ සාකච්ඡාවකි.

04. ජෝන්, කේ. වයස අවුරුදු 65, අකුරු හැකියාව ඇත, රැකියාව ගොවිතැන ලිපිනය : පෙතියකන්ද, කුඩව, වැද්දාගල. 2013.09.26 දින සිය නිවසේ කළ සම්මුඛ සාකච්ඡාවකි.

05. පියරත්න, කේ, ඒ, වයස අවුරුදු 69, අකුරු හැකියාව ඇත, ගොවිතැන, ලිපිනය : වැවගම, කොක්කාවිට, කලවාන. 2013.11.24 දින කරුණාදාස මහතාගේ පරණ නිවසේදී කරන ලද සම්මුඛ සාකච්ඡාවකි.

06. ප්‍රේමරත්න, පී. එල්, වයස අවුරුදු 52, අකුරු හැකියාව ඇත, රැකියාව ගොවිතැන, ලිපිනයඃ බුත්කන්ද, කුඩව, වැද්දාගල. 2013.08.03 දින සිය නිවසේ සිදු කළ සම්මුඛ සාකච්ඡාවකි.

07. බණ්ඩාර, පද්මසේකර, වයස අවුරුදු 49, අකුරු හැකියාව ඇත, රැකියාව ගොවිතැන, ලිපිනයඃවැවගම, කොක්කාවිට, කලවාන. 2013.08.15 දින කරුණාදාස මහතාගේ පැරණි නිවසේ දී සිදු කළ සම්මුඛ සාකච්ඡාවකි.

08. සිරිපාල, පී.එල්, වයස අවුරුදු 55, අකුරු හැකියාව ඇත, රැකියාව ගොවිතැන, ලිපිනය : පල්ලෙදෙණිය, පෙතියකන්ද, කුඩව, වැද්දාගල. 2013.09.11 දින සිය නිවසේදී සිදු කළ සම්මුඛ සාකච්ඡාවකි.

09. සිරිසේන, ආර්. කේ. වයස අවුරුදු 67, අකුරු හැකියාව ඇත, රැකියාව ගොවිතැන, ලිපිනය : පෙතියකන්ද, කුඩව, වැද්දාගල. 2013.09.16 දින සිය නිවසේදී සිදු කළ සම්මුඛ සාකච්ඡාවකි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

කහඳගමගේ,පියසේන, (2000) වන තරණය, ගොඩගේ කොළඹ

කහඳගමගේ,පියසේන, (2004) වනේ ඇඳුණු පිය සටහන්, ගොඩගේ කොළඹ

කහඳගමගේ,පියසේන, (1999) හේනේ විත්ති, ගොඩගේ කොළඹ

ගුණසෝම,පී, (2009) පානම්පත්තුවේ අසිරිය, ගොඩගේ කොළඹ

මායාරංජන්, (1961) මගේ රාජ්‍යය, ගොඩගේ කොළඹ

මායාරංජන්, (1967) අපේ රාජ්‍යය, ගොඩගේ කොළඹ

මායාරංජන්, (1957) දිගාමඩුල්ලේ ආශ්චර්යය, ගොඩගේ කොළඹ